රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල

Richmond College - Galle

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018

**General Certificate of Education (Advance Level) Examination 2018**

| 23 | S | I |
|---|---|---|

දේශපාලන විද්‍යාව I

**Political Science I**

පැය 2 යි.

**Two Hours.**

## A කොටස

- අංක 1 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ පහ අකුරෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. දේශපාලන විද්‍යාව
   A. පැරණිතම සමාජ විද්‍යාව ලෙස සැලකේ.
   B. මිනිසුන්ගේ දේශපාලන චර්යාව පිළිබඳ සැලකිලිමත් වේ.
   C. ආරම්භය ක්‍රි.පූ. 4 වන සියවසේ ග්‍රීසිය තුල සිදුවිය.
   D. තවත් එක් ස්වභාවික විද්‍යාවකි.
   E. 20 වන සියවසේදී අතිශය පුළුල් විෂය ධාරාවක් බවට පත්විය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

2. දේශපාලනය,
   A. සමාජයක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් හා මතවාද පදනම් කරගෙන පැන නගී.
   B. බලය අල්ලා ගැනීම - රඳවා ගැනීම - ව්‍යාප්ත කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ.
   C. වර්තමානයේ දේශපාලන පක්ෂ සහ දේශපාලඥයින් පෙරමුණ ගනී.
   D. බල අරගලය විදනාමාන කරණු ලබන්නක් වේ.
   E. යුක්තිය - සදාචාරය - ආගම වැනි සාධක මගින් පාලනය වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

3. රාජ්‍යයේ ආරම්භය,
   A. දේවවරම් වාදින්ට අනුව දෙවියන් වහන්සේගේ නිර්මාණයකි.
   B. සමාජ සම්මුතිවාදින්ට අනුව සමාජ සම්මුතියක ප්‍රතිඵලයකි.
   C. ලිබරල් වාදින්ට අනුව පොදු යහපත සඳහා මිනිසුන් පිහිටුවා ගනු ලැබූවකි.
   D. මාක්ස් වාදින්ට අනුව පෞද්ගලික දේපල පැන නැගීමේ ප්‍රතිඵලයකි.
   E. පැසිස්ට් වාදින්ට අනුව සමාජ විකාශණයක ප්‍රතිඵලයකි.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

4. රාජ්‍යය,
   A. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය යන අංග වලින් සමන්විත වේ.
   B. සියළු සමාජ සංවිධාන අතුරින් උත්තරීතම සමාජ සංවිධානය වේ.
   C. අනෙකුත් සමාජ සංවිධාන වලට හිමිවන පරමාධිපති බලය මෙයට ද සමානව හිමි වේ.
   D. ප්‍රභවයන් ස්වභාවයන් විවිධ දේශපාලන න්‍යායන් විවිධාකාරයෙන් අර්ථ දක්වනු ලැබේ.
   E. සංකල්පයක් ලෙස පිළිගනු ලැබේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

5. ස්වාධිපති බලය,
   A. රාජ්‍යයට පමණක් හිමිවන බලයකි.
   B. ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ආයතන මගින් භුක්ති විඳී.
   C. පුද්ගලයාගේ ජීවිතය හා මරණය පිළිබඳව තීන්දු ගැනීමේ හැකියාව ඇත.
   D. ඕනෑම අවස්ථාවක රාජ්‍යයට මෙම බලය අතහැරිය හැක.
   E. රාජ්‍ය නීතිවලට සුජාතභාවය සපයනු ලැබේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

6. ආණ්ඩුව,

A. රාජ්‍යයක පාලන අංශය වේ.

B. රාජ්‍යය වෙනුවෙන් ස්වාධිපති බලය ක්‍රියාවට නංවන්නාය.

C. නොවෙනස් වුත් ස්ථාවර වුත් දෙයකි.

D. එහි කාර්යයන් සම්බන්ධයෙන් ජනතාව වගකීමට බැඳී සිටී.

E. රාජ්‍යය හා ජනතාව එකට යා කරන මාධ්‍යය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

7. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ,

A. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මූලික කරගෙන ක්‍රියාත්මක වීම.

B. ජනතාව වගකීමට බැඳී සිටීම.

C. මහජනතාව විසින් පාලකයන් පත් කිරීම.

D. ව්‍යවස්ථාදායක විධායක අධිකරණ ලෙස බලය බෙදා තිබීම.

E. ඒක පක්ෂ ආධිපත්‍යයක් පැවතීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

8. සමාජවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වන්නේ,

A. කොමියුනිස්ට් සමාජ ක්‍රමයක් ගොඩනැගීම සඳහා ක්‍රියා කිරීම.

B. සමාජ බහුවිධතාව ප්‍රතික්ෂේප කිරීම.

C. කොමියුනිස්ට් පක්ෂය විසින් සියල්ල මෙහෙයවීම.

D. පොදු දේපල ක්‍රමයක් ස්ථාපිත කිරීම.

E. පංති සමාජය ආරක්ෂා කිරීම.

9. ආණ්ඩුවක බලය ක්‍රියාවට නංවන මාර්ග වන්නේ,

A. ආණ්ඩුවක බලය නීත්‍යානුකූල වේ. යන අදහස විශ්වාස කිරීමට ජනතාව පෙළඹවීම.

B. වරදාන දීම සහ තර්ජනය කිරීම මගින්.

C. බලය යෙදවීම මගින්.

D. ආගමික හා සදාචාරාත්මක විශ්වාස මගින්.

E. දඬුවම් කිරීම මගින්.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. සන්ධීය ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ,

A. මධ්‍යම ආණ්ඩුවේ බලතල හා ප්‍රාන්ත ආණ්ඩුවල බලතල මූලික නීතිය මගින් බෙදා තිබීම.

B. මධ්‍යම හා සන්ධීය ආරවුල් විසඳීමට ස්වාධීන අධිකරණයක් පැවතීම.

C. සන්ධීය ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවට යටත් වීම.

D. මධ්‍යම හා සන්ධීය ලෙස ස්වාධිපති බලය හවුලේ ක්‍රියාවට නැංවීම.

E. තල දෙකක ආණ්ඩු පැවතීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. ඒකීය ආණ්ඩු ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ,

A. දේශපාලන බල අධිකාරය මධ්‍යම ආණ්ඩුව තුළින් පමණක් ක්‍රියාත්මක වේ.

B. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය පවරන පළාත් පාලන ආයතන පැවතීම.

C. ඒකීය පුරවැසිභාවයක් - නීති ක්‍රමයක් අධිකරණ ක්‍රමයක් සිවිල් සේවයක් පැවතීම.

D. මධ්‍යම ආණ්ඩුවෙන් පමණක් ජාතියේ ආශාවන් ප්‍රකාශ කිරීම.

E. ස්වාධිපති බලය සම්බන්ධ මධ්‍යම ආණ්ඩුවේ ඒකාධිකාරයක් පැවතීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

12. කැබිනට් ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ,

A. විධායකයන් 2ක් පැවතීම.

B. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තෝරා ගැනීම.

C. විධායකය ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වීම.

D. ව්‍යවස්ථාදායකයට විධායකය පාලනය කල හැකි වීම.

E. ව්‍යවස්ථාදායකය සහ විධායකය වෙන වෙනම මැතිවරණ වලින් තේරී පත් වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. ජනාධිපති ආණ්ඩුක්‍රයක මූලික ලක්ෂණ වන්නේ,

A. ස්ථාවර භාවයෙන් වැඩි ආණ්ඩු පිහිටුවිය හැකි වීම.
B. බලතල බෙදීමේ පදනම මත ගොඩනැගීම.
C. බහුවිධ සමාජයක් සඳහා භාවිතා කල හැකි වීම.
D. ව්‍යවස්ථාදායකයට විධායකය වග නොකීම.
E. කැබිනට් ආණ්ඩු ක්‍රමයකට වඩා වැඩි ප්‍රජාතන්ත්‍රවාදයක් තහවුරු කල හැකි වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. ව්‍යවස්ථාදායකය,

A. ඒක මණ්ඩලික හෝ ද්වි මාණ්ඩලික විය හැක.
B. නීති සම්පාදන කාර්යය මූලික කොට සලකයි.
C. විධායකය පාලනය කිරීමේ බලතල හිමිව පවතී.
D. තත්වයෙන් හා වරප්‍රසාද වලින් එක හා සමාන සාමාජික පිරිසක් සිටී.
E. මහජන ඡන්දයෙන් තේරී පත්වන සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. විධායකය,

A. ව්‍යවස්ථාදායකය තුළින් මෙන්ම මහජන ඡන්දයෙන් ද තේරී පත් වේ.
B. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල ජනාධිපති - අර්ධ ජනාධිපති කැබිනට් වශයෙන් ත්‍රිවිධාකාර වේ.
C. ඕනෑම දේශපාලන ක්‍රමයක දේශපාලන පිරමීඩයේ ඉහළම නිළය වේ.
D. ව්‍යවස්ථාදායකයට මෙන්ම අධිකරණයටද බලපෑම් කළ හැකි වේ.
E. ව්‍යවස්ථාදායකයේ බහුතර බලය හා විධායකය එකම පක්ෂයකින් ඇති විට පාලනය ආඥාදායක විය හැක.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- **අංක 15 සිට 25 දක්වා ප්‍රශ්ණවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් එක් ප්‍රකාශයක් වැරදිය. වැරදි ප්‍රකාශය තෝරන්න.**

16. බලතල බෙදීමේ න්‍යාය මගින් අවධාරණය කරන්නේ,

1. ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ ලෙස ආණ්ඩුවේ කාර්යයන් ත්‍රිවිධාකාර වන බවයි.
2. ආණ්ඩුවේ කාර්යයන් එකිනෙකට වෙන් වූ ආයතන මගින් සිදුකල යුතු බවයි.
3. එක් එක් ආයතන තමන්ට පැවරී ඇති විෂයන්ට අදාළව ක්‍රියාත්මක විය යුතු බවයි.
4. බලතල බෙදීමෙන් ජනතාවගේ නිදහස ආරක්ෂා වන බවයි.
5. එක් ආයතනයක් සිය කාර්යයන් ඉටු කිරීමේ දී දුර්වල නම් වෙනත් ආයතනයක් විසින් ඒවා ඉටුකළ යුතු බවයි.

17. මානව අයිතිවාසිකම්,

1. මනුෂ්‍යයෙක් වීම නිසාම හිමිවන අයිතිවාසිකම් වේ.
2. දුගීභාවයන් - අව වරප්‍රසාදිත තත්වය යටතේ අර්ථ විරහිත වේ.
3. රාජ්‍යයේ පුරවැසියන්ට පමණක් බුක්ති විඳිය හැකි වේ.
4. අර්ථවත් වීමට නම් ගරු කිරීම අවශ්‍ය වේ.
5. විශ්වීය වේ - අසභාය වේ.

18. දේශපාලන පක්ෂ,

1. දේශපාලන බලය ලබා ගැනීමේ දී ප්‍රභල කාර්ය භාර්යක් ඉටු කරයි.
2. නූතන දේශපාලන ක්‍රියාවලිය තුළ ජනතාව සංවිධානය කිරීමේ කාර්ය භාර්ය සිදු කරයි.
3. ජනතා සහ කේඩර ලෙස වර්ගීකරණය කරනු ලැබේ.
4. නිල කාඩ්පතක් මගින් සාමාජිකත්වය හිමි වේ.
5. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීමේ දී මේවා අත්‍යාවශ්‍යම නොවේ.

19. බලපෑම් කණ්ඩායම්,

1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ පමණක් දැකිය හැකිය.
2. ආණ්ඩුවක ප්‍රතිපත්ති හෝ ක්‍රියාවන්ට බලපෑම් කරනු ලබයි.
3. ආශා කණ්ඩායම් ලෙසද හඳුන්වයි.
4. පෞද්ගලික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධානය කෙරේ.
5. ක්‍රි.පූ. අවධියේ සිට දැකිය හැකි වේ.

20. පුරවැසිභාවය,

1. රාජ්‍යයක පූර්ණ සාමාජිකයන්ට පමණක් හිමි වේ.
2. තමන් කැමැති ඕනෑම විටක අත්හැරීමට - නැවත ලබා ගැනීමට හැකි වේ.
3. පුරවැසියන්ට අයිතිවාසිකම් මෙන්ම යුතුකම් ප්‍රමාණයක් ද පවතී.
4. විශේෂිත පිරිසකට පමණක් රාජ්‍යයන් කීපයක පුරවැසිභාවය හිමි වේ.
5. සාමාන්‍යයෙන් පුරවැසිභාවය හිමිවන්නේ උපතිනි.

21. අන්තර් ජාතික දේශපාලනයේ රැඟුම්කරුවන් වන්නේ,

1. නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්
2. පුද්ගලයින්
3. අන්තර් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන
4. බහුජාතික සමාගම්
5. බලපෑම් සහගත ඉතා වැදගත් පුද්ගලයන්

22. ගැටුම්,

1. සමහර සමාජයන්හි පමණක් තිබෙන්නා වූ සමාජ ප්‍රචණ්ඩයක් වේ.
2. පුද්ගල හා සමාජ විවිධත්වයේ අවසාන ප්‍රතිඵලයකි.
3. විනාශකාරී මෙන්ම ප්‍රවර්ධනාත්මක ද විය හැක.
4 පුද්ගලයන්, කණ්ඩායම්, රාජ්‍යයන් අතර හට ගනී.
5. විසඳීම සඳහා සාමකාමී මෙන්ම යුධමය ක්‍රියාමාර්ග ද භාවිතා කල හැකි වේ.

23. රාජ්‍ය ප්‍රතිපත්ති,

1. පොදු ප්‍රශ්ණ විසඳා ගැනීම අපේක්ෂා කරයි.
2. අනුගමනය කරන න්‍යායන් - මතවාද අනුව වෙනස් වේ.
3. ජන ජීවිතයට දැඩි බලපෑම් කරනු ලබයි.
4. පෞද්ගලික අංශයේ තීරණ හා ප්‍රතිපත්ති වේ.
5. විශේෂිත ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් සැලසුම් කරනු ලබයි.

24. නිදහස් හා සාධාරණ මැතිවරණයක මූලික ලක්ෂණ වන්නේ,

1. නියමිත කාලයට පැවැත්වීම.
2. සුදුසුකම් සහිත ඕනෑම අයෙකුට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් විය හැකි වීම.
3. තමන්ට තීරණ ගැනීමේ අයිතිය ඡන්ද දායකයාට පූර්ණ වශයෙන් හිමිකර දීම.
4. ජනවර්ගය-ආගම-කුලය-ප්‍රාදේශීය බව.
5. අපේක්ෂකත්වය සමාජ ප්‍රභූන්ට පමණක් සීමා කිරීම.

25. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණ වන්නේ,

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන ක්‍රියාත්මක වීම.
2. ආණ්ඩුකරණයේ විනිවිධභාවය.
3. නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම.
4. මාධ්‍ය නිදහස.
5. මානව අයිතිවාසිකම් සීමා කිරීම.

- අංක 25 සිට 30 දක්වා නිවැරදි ප්‍රකාශය තෝරන්න.

26. මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව,
    1. නීති සම්පාදනය පිළිබඳ උත්තරීතර වේ.
    2. කැබිනට් මණ්ඩලයට වග කියන්නේ ය.
    3. සමාන බලැති මණ්ඩල දෙකකින් සමන්විත වේ.
    4. රැස්වන්නේ වසරකට දෙවතාවක් පමණි.
    5. නිල කාලය වසර 02 කි.

27. මහා බ්‍රිතාන්‍යයේ අගමැතිවරයා,
    1. පොදු රාජ්‍ය මණ්ඩලයේ නායකයා වේ.
    2. කැබිනට් මණ්ඩලයේ නායකයා වේ.
    3. රාජාධිකරණයේ නායකයා වේ.
    4. සාමි මන්ත්‍රී මණ්ඩලයේ නායකයා වේ.
    5. යාව ජීව ධූරයක් වේ.

28. ඇමෙරිකානු ජනාධිපතිවරයා,
    1. සිය විධායකයා තීන්දු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වේ.
    2. විශ්වාසභංගයක් සම්මත කිරීමෙන් ඉවත් කළ හැක.
    3. ජනතාවගේ චක්‍ර මහජන ඡන්දයෙන් තේරිපත් වේ.
    4. නිල කාලය වසර 06කි.
    5. ධූරය දැරිය හැකි වාර ගණන ව්‍යවස්ථාවේ දක්වා නැත.

29. ඉන්දියාව,
    1. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක කරයි.
    2. 1947 සිට එරට පවතින්නේ ඒකීය ආණ්ඩු ක්‍රමයකි.
    3. නාමික විධායක ධූරය ජනාධිපති නමින් හඳුන්වයි.
    4. ව්‍යවස්ථාදායකය ඒක මාණ්ඩලික ආයතනයකි.
    5. එරට පක්ෂ ක්‍රමය ද්වි පක්ෂ ක්‍රමයකි.

30. ප්‍රංශ ආණ්ඩු ක්‍රමය,
    1. ව්‍යවස්ථාදායකය තනි මණ්ඩලයකින් සමන්විතය.
    2. ජනාධිපති සහ අගමැති හා අමාත්‍ය මණ්ඩලය ලෙස විධායකයන් දෙකකි.
    3. ස්ථාවර ද්වි පක්ෂ ක්‍රමයක් පවතී.
    4. ජනාධිපති ව්‍යවස්ථාදායකය තුළින් තෝරා ගනී.
    5. ජනාධිපති සහ අගමැති යන දෙදෙනාම ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී.

- බහුතර සහ සමානුපාතික ආයෝජන ක්‍රම වලට අදාළ ලක්ෂණ සමහරක් පහත දක්වා ඇත. ඒ අනුව ප්‍රශ්ණ 31 සහ 32 සඳහා පිළිතුරු සපයන්න.

A. වැඩිම ඡන්ද ගණනාවක් ලබා ගන්නා තේරී පත් වේ.

B. ආසන වෙන් කිරීම, ලබන ඡන්ද ප්‍රතිශතය මත සිදු වේ.

C. කුඩා පක්ෂ හා කණ්ඩායම් වලට නියෝජනයේ වැඩි ඉඩක් හිමි වේ.

D. අඩු ඡන්ද ප්‍රමාණයක් මත වැඩි ආසන සංඛ්‍යාවක් ලැබීමට ඉඩ ඇත.

E. ඡන්දදායකයා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවයට ඇති ඉඩ කඩ අඩුවේ.

F. විශාල පක්ෂ වලට වඩා වාසිදායක වේ.

31. සරල බහුතර නියෝජන ක්‍රමයට අදාළ කාණ්ඩය තෝරන්න.

32. සමානුපාතික නියෝජන ක්‍රමයට අදාළ කාණ්ඩය තෝරන්න.

- ප්‍රශ්ණ අංක 33 සහ 34 සඳහා දී ඇති පිළිතුරු අතුරෙන් 1ක් පිළිතුරක් වැරදි පිළිතුර තෝරන්න.

33. ලංකාවේ පළාත් සභා,
1. පිහිටුවා ඇත්තේ 1978 ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනය මගිනි.
2. හඳුන්වා දුන්නේ රටේ වාර්ශික ප්‍රශ්ණයට දේශපාලන විසඳුමක් ලෙසය.
3. පිහිටුවා ඇත්තේ දිස්ත්‍රික්කයකට එකක් වන පරිදිය.
4. ජනාධිපති විසින් පත් කරන ආණ්ඩුකාරවරයකු සිටී.
5. අමාත්‍ය මණ්ඩලය 4 කට සීමා වේ.

34. පළාත් පාලන ආයතන,
1. මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ලෙස වර්ග 3කි.
2. පළාත් සභාවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.
3. තම බල ප්‍රදේශය තුල සමාජ ප්‍රයෝගයතා සේවා ඉටු කරයි.
4. වසර 4 ක නිල කාලයක් සඳහා තේරී පත් වේ.
5. විසුරුවා හැරීමේ බලය පළාත් ආණ්ඩුකාරවරු සතුවේ.

35. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා වැරදි ප්‍රකාශය තෝරන්න.
1. බ්‍රිතාන්‍ය කිරීටයේ මෙන්ම බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ද නියෝජිතයා විය.
2. නාමික විධායකයකු ලෙස ක්‍රියා කිරීම අපේක්ෂා කළේය.
3. ව්‍යවස්ථාදායක කාර්යයන්ගෙන් බැහැර කරනා ලදී.
4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ආරක්ෂකයා විය.
5. අවධාරිත බලතල බුක්තිවිඳින ලදී.

36. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නිලධාරිහු,
1. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී.
2. ව්‍යවස්ථාවේ මුර බල්ලන් ලෙස සලකන ලදී.
3. අභ්‍යන්තර කැබිනට් මණ්ඩලයක් ලෙස ක්‍රියාකරන ලදී.
4. මුදල් පරිපාලන හා නීති යන අමාත්‍යාංශ භාරව කටයුතු කරන ලදී.
5. ආණ්ඩුකරු හා එක්ව කටයුතු කරන ලදී.

37. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
ඩොනමෝර් ප්‍රතිසංස්කරණ සමස්ථයක් ලෙස,
1. ලාංකිකයන්ට සැලකිය යුතු ප්‍රමාණයක විධායක බලතල සහ වගකීම් පැවරීය.
2. ලාංකීයන්ට ස්වයං පාලනය පිළිබඳ පුහුණුව සැපයීය.
3. සාමාන්‍ය ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය කළේය.
4. වාමාංශික ව්‍යාපාරය ශක්තිමත් කිරීමට සහාය විය.
5. ආණ්ඩුකරුගේ බලතල අඩු කළේය.

38. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1948 සෝල්බරි ව්‍යවස්ථාව,

1. ලංකාවට ඩොමිනියන් තත්වය ප්‍රධානය කරන ලදී.
2. බ්‍රිතාන්‍ය රැජිණ තවදුරටත් රාජ්‍ය නායකයා ලෙස රඳවන ලදී.
3. කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දෙන ලදී.
4. නාමික විධායකය ලෙස අග්‍රාණ්ඩුකරු හඳුන්වා දෙන ලදී.
5. ලංකාවට කොමියුනිස්ට් රටවල් සමඟ සම්බන්ධතා පැවැත්වීම තහනම් කරන ලදී.

39. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයා,

1. බ්‍රිතාන්‍ය කිරීටය නියෝජනය කළේය.
2. ආණ්ඩුවේ නාමික විධායකය විය.
3. ලංකාවේ පාර්ලිමේන්තුවට ඉවත් කල හැකි විය.
4. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායන් අනුගමනය කිරීම අපේක්ෂාව විය.
5. බ්‍රිතාන්‍ය රැජිණ විසින් නිල වශයෙන් පත් කරනු ලැබීය.

40. වැරදි ප්‍රකාශය තෝරන්න.

සෝල්බරි සෙනෙට් සභාව,

1. දෙවන මණ්ඩලය ලෙස හඳුන්වන ලදී.
2. සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත විය.
3. අග්‍රාණ්ඩුකාරවරයා යටතේ ක්‍රියාත්මක විය.
4. මුදල් පනත මාසයකටත්- සාමාන්‍ය පනත් මාස 06කටත් ප්‍රමාද කල හැකි විය.
5. 15 දෙනෙකු අග්‍රාණ්ඩුකරුගේ නාමකරණයෙන් පත්විය.

41. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

1. ශ්‍රී ලංකාව නිදහස් ස්වාධීන ස්වෛරී ඒකීය රාජ්‍යයක් බවට පත් කරන ලදී.
2. ආණ්ඩුක්‍රම යාන්ත්‍රනය බලතල බෙදීමේ මූලධර්මය මත ගොඩනගන ලදී.
3. බුද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන ලදී.
4. බ්‍රිතාන්‍යය සමඟ පැවති සියළු ව්‍යවස්ථානුකූල සම්බන්ධතා අත්හරින ලදී.
5. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

42. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ වන්නේ,

1. සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය පත් කිරීම.
2. ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ බලතල සංකේන්ද්‍රනය වූ ස්වාධිපති ව්‍යවස්ථාදායකය.
3. පනත් වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීමේ බලය සහිත අධිකරණය.
4. සහතික කිරීම සඳහා නීතිමය ආවරණ රහිත මූලික අයිතිවාසිකම් පරිච්ඡේද.
5. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම මාලාව.

43. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ,

A. ලංකාව යනුවෙන් භාවිතා කල රටේ නිල නාමය ශ්‍රී ලංකාව ලෙස වෙනස් කළේය.

B. ශ්‍රී ලංකාව නිදහස් ස්වාධිපති හා ස්වෛරී සමූහාණ්ඩුවක් බවට පත් කළේය.

C. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ මූලික නීතිය ලෙස ස්ථාපිත කළේය.

D. ශ්‍රී ලංකා ජනරජයේ ස්වාධිපති බලය ජනතාව වෙත පිහිටුවීය.

E. ජනතා පරමාධිපත්‍යය ජනතාව විසින් මැතිවරණ හරහා ක්‍රියාවට නංවන පරිදි මහජනතාව සවිබල ගැන්වීය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

44. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේ දී භාවිතයට ගත් දේශපාලන න්‍යායන් වන්නේ,

A. බලතල බෙදීමේ න්‍යාය

B. පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය

C. සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය

D. මහජන ස්වාධිපති න්‍යාය

E. සාමූහික වගකීමේ න්‍යාය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

45. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.

1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් දේශපාලන නවාංගයන් වන්නේ,

A. විධායක ජනාධිපති ක්‍රමය

B. ද්විත්ව විධායක ක්‍රමය

C. ඔම්බුඩ්ස්මන්

D. පළාත් සභා ක්‍රමය

E. රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

46. වැරදි ප්‍රකාශය තෝරන්න.

1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය,

A. මූලික නීතිය යටතේ පිහිටුවා ඇත.

B. අධිකරණ පද්ධතියේ ඉහලම අධිකරණ ආයතනය වන්නේය.

C. සමන්විත වන්නේ අගවිනිසුරු සහ තවත් විනිසුරුවන් 6 ත් 10 ත් අතර සංඛ්‍යාවකි.

D. ස්වකීය තීරණ සම්බන්ධයෙන් ජනාධිපතිට වගකිව යුතුය.

E. ජනාධිපතිට උපදේශාත්මක මත ලබා දීමට බැදී.

47. වැරදි ප්‍රකාශය තෝරන්න.

1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා,

A. රාජ්‍යයේ, ආණ්ඩුවේ, විධායකයේ නායකයා වන්නේය.

B. ඉහල රාජ්‍ය නිලධාරීන් පත්කිරීමට බලය ඇත්තේ ය.

C. පාර්ලිමේන්තුව සම්මත කරණ දෝෂාභියෝගයක් මගින් නිලයෙන් ඉවත් කල හැකිය.

D. 6 අවුරුදු නිල කාලයක් සඳහා ජනතාව විසින් පත් කරන්නේ ය.

E. ස්ව අභිමතය අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් ඉවත් කල හැක.

48. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව ආණ්ඩු වර්ග කරනු ලබන්නේ,

A. කැබිනට් වෙත් පාර්ලිමේන්තු

B. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

C. ජනාධිපති

D. මිශ්‍ර විධායක

E. ඒකතන්ත්‍ර

49. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

කැබිනට් ආණ්ඩු ක්‍රමය ජනාධිපති ආණ්ඩු ක්‍රමයකින් වෙනස් වන සාදක වන්නේ,

A. විධායක තේරී පත්වන ආකාරය

B. විධායක ව්‍යවස්ථාදායක සම්බන්ධතා

C. ආණ්ඩුවේ ව්‍යුහය හා කාර්යයන්

D. ප්‍රජාතන්ත්‍රික භාවයේ ප්‍රමාණය

E. ස්ථාවර භාවය හා කාර්යක්ෂම භාවය

50. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

මහජනතාව ආණ්ඩුව සමඟ යා කරන මාර්ග වන්නේ,

A. මැතිවරණ

B. ජනමත විචාරණය

C. දේශපාලන පක්ෂ

D. රාජ්‍ය නොවන සංවිධාන

E. බලපෑම් කණ්ඩායම් සහ මහජන මතය

රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
Richmond College - Galle
අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018
General Certificate of Education (Advance Level) Examination 2018

| 23 | S | II |
|---|---|---|

දේශපාලන විද්‍යාව II
Political Science II

පැය 3 යි.
Three Hours.

## A කොටස

01. පහත ප්‍රකාශයන්ට අදාල දේශපාලන න්‍යායන් දක්වන්න.
   i. රාජ්‍යය පංතියක ආයුධයකි. ..........
   ii. රාජ්‍යය සමාජ සංවිධානයකි ..........

02. රාජ්‍යය සමාජ විකාශණයක ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දුන් දේශපාලන මතවාද 02ක් දක්වන්න.
   i. .......... ii. ..........

03. රාජ්‍යය සහ අන්‍ය සමාගම් අතර වෙනස්කම් 02ක් දක්වන්න.
   i. ..........
   ii. ..........

04. දේශපාලන විද්‍යා විෂය ආරම්භ වුනු රට සහ කාල වකවානුව දක්වන්න.
   ..........

05. පහත සඳහන් කරුණු කෙටියෙන් නිර්වචනය කරන්න.
   i. ජාතිය - ..........
   ii. ජාතිකත්වය - ..........
   iii. වාර්ගිකත්වය - ..........

06. රාජ්‍යයන් සමාන වුවත් ආණ්ඩු සමාන නොවේ. ආණ්ඩු වර්ග 04ක් දක්වන්න.
   i. .......... ii. ..........
   iii. .......... iv. ..........

07. පද්ධති විශ්ලේෂණ ක්‍රමය ඉදිරිපත් කල ප්‍රධාන බුද්ධිමතෙකු නම් කරන්න.
   ..........

08. දෙවන ලෝක යුද්ධයෙන් පසු දේශපාලන විද්‍යාවට එක් වූ සාධක 02ක් දක්වන්න.
   i. ..........
   ii. ..........

09. බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාදායකගේ මණ්ඩල 02කි. සාමාජිකත්වය දක්වන්න.
   i. .......... ii. ..........

10. කෝල්බෲක් කැමරන් යෝජනා මගින් මෙරට ආර්ථිකය තුළ සිදු වූ පරිවර්තනය දක්වන්න.
   ..........
   ..........

11. මැනිං ඩෙවොන්ෂෙයර් ප්‍රතිසංස්කරණ මගින් නිර්මාණය කරන ලද ගැටළුව දක්වන්න.

..........................................................................................................................................................

12. ඩොනමෝර් රාජ්‍ය මන්ත්‍රන සභාව තුලින් එකිනෙකට වෙනස් ද්විත්ව කාර්යයන් ඉටුකරන ලදී.

..........................................................................................................................................................

13. ඩොනමෝර් ව්‍යවස්ථාදායකයේ මුලසුන දරන ලද්දේ.

..........................................................................................................................................................

14. ඩොනමෝර් අමාත්‍ය මණ්ඩලයේ සංයුතය දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

15. සෝල්බරි ව්‍යවස්ථාදායකයේ මණ්ඩල 02ක් දක්වා ඒවායේ සාමාජික සංඛ්‍යාව දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

16. රාජ්‍ය සේවය පාලනය සඳහා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිට වූ මණ්ඩල 02 නම් කරන්න.

i. ..........................................................................

ii. ..........................................................................

17. 72 ව්‍යවස්ථාව මගින් පිහිට වූ විශේෂ අධිකරණය දක්වන්න.

..........................................................................................................................................................

18. 1978 ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට පවරා දී ඇති බලතල, සංවරණය සඳහා කරන ලද ව්‍යවස්ථා සංශෝධනය දක්වන්න.

..........................................................................................................................................................

19. 78 ව්‍යවස්ථාවෙන් පළාත් පාලන ආයතන වලට බලය පවරා දී ඇත්තේ ..................................... මගිනි. පලාත් සභා වලට බලය පවරා දී ඇත්තේ .......................................................... මගිනි.

20. 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නවාංගයන් 03ක් දක්වන්න.

i. ..........................................................................................................................

ii. ..........................................................................................................................

iii. ..........................................................................................................................

- B කොටසෙන් හා C කොටසෙන් ප්‍රශ්න 2 බැගින් තෝරාගෙන පිළිතුරු සපයන්න.

## B කොටස

01. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පැහැදිලි කරන්න.

02. පහත දැක්වෙන මාතෘකා වලින් දෙකක් විභාග කරන්න.

   i. බලතල බෙදීමේ න්‍යාය
   ii. ව්‍යවස්ථානුකූල වාදය
   iii. නීතියේ ආධිපත්‍යය
   iv. අධිකරණයේ ස්වාධීනත්වය .

03. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් විභාග කරන්න.

   i. රාජ්‍යය හා ආණ්ඩුව
   ii. රාජ්‍යය හා සමාජය
   iii. රාජ්‍යය හා ස්වෙච්ඡා සමාගම්
   iv. රාජ්‍යය හා ජාතිය

04. පහත දැක්වෙන මාතෘකා වලින් දෙකක් සාකච්ඡා කරන්න.

   i. ඇමෙරිකාවේ ජනාධිපතිවරයා
   ii. බ්‍රිතාන්‍යයේ රැජින
   iii. ඉන්දියාවේ අර්ධ සන්ධීයභාවය
   iv. ස්විට්සර්ලන්තයේ විධායකය

## C කොටස

05. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන මෙරට සමාජ ආර්ථික දේශපාලන ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් පැහැදිලි කරන්න.

06. ඩොනමෝර් ව්‍යවස්ථාව පදනම් කරගෙන පිළිතුරු සපයන්න.

i. රාජ්‍ය මන්ත්‍රන සභාව

ii. ආණ්ඩුකාරවරයා

iii. අමාත්‍ය මණ්ඩලය

07. පහත ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.

i. සෝල්බරි ව්‍යවස්ථාවේ සුළු ජන අයිතිවාසිකම් විධි විධාන

ii. 1972 ජාතික රාජ්‍ය සභාව

iii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

08. 1978 ව්‍යවස්ථාව පදනම් කරගෙන පිළිතුරු සපයන්න.

i. ජනාධිපති පත්කරන ආකාරය

ii. පාර්ලිමේන්තුවේ බලතල

iii. ශ්‍රේෂ්ඨාධිකරණය